30 වන පිටුවෙන් (පොඩි කොලුවයි)

වතුර උණු කරන ළිප අසල මාමා විසින් මට සකස් කරදෙන ලද උණවෙඩිල්ල පත්තු කරමින් සිටින අතර අපේ ගෙය පිටුපස ඇති හබරල ගාල අතරින් "ෂ් ෂ්" යනුවෙන් නැගුණු ශබ්දය දෙස බලන විට සිටියේ මාමා සහ තවත් ගමේ ම අයකු ය. මාමා මට ඔහු ළඟට පැමිණෙන ලෙස අතින් කළ සංඥාව අනුව ඔවුන් ළඟට ගියෙමි. මාමා සහ අනිත් කෙනා සාමාන්‍ය විලාසයෙන් මදක් ඔබ්බට ගොස් තිබුණු අතර දෙනොගේ ම මුහුණුවලින් දිස්වූයේ ශාන්ත පෙනුමක් නො වේ. මාමා තම අතේ තිබුණු බීඩියෙන් උගුරක් ඇද එම බීඩිය අනෙකාට දී මගේ කනටකර සෙමින් තරමක් සෙලවෙන හඬකින් කතා කළේ ය.

"පුතේ"

"මොකෝ?''

"උඹට බැරිද පොඩි වැඩක් කරන්න"

"මොකක්ද?"

"හෙමින් සැරේ කුස්සියෙ දුම උඩින් කොකිස් හත අටක් ගෙනත් දියන්කො පුතේ. උඹත් එකක් ගනින්."

කොකිස් කියන විට මගේ කටට දැනුණු මිහිරි කිරි රස මතක් වී දිව නලියන්නට විය. එසේ වුවද ආච්චිගෙන් අසා දැනගත් බණ දහමට අනුව හොරකම් කිරීම මහා පාපයකි. අපායට යාමට එක හේතුවකි. කිසි දවසක කිසිවක් හොරකම් කර නැති මට එය නුහුරු දෙයකි. ඔවුනගේ අවශ්‍යතාවය වී තිබුණේ මත්පැන් පානය කරන විට කටගැස්ම සඳහා කොකිස් විකීම ය. මම මාමාගේ යෝජනාව ප්‍රතික්ෂේප කළෙමි.

"ගොනෝ උඹත් එකක් ගනින්. දහයක් විතර ගෙනෙන්. උඹට හැන්දෑවට එනකොට රතිඤ්ඤා පෙට්ටියකුත් ගේන්නං"

"ඔව් පොඩිඑකෝ රතිඤ්ඤා ගේන්නං" අනෙකා පැවසුවේ කටේ බේරෙමින් තිබුණු කෙළ රැල්ල පසෙකට ගසමින් ය.

දැන් කොකිස්වල රසත් රතිඤ්ඤා වල ශබ්දයත් මගේ සිත තුළ පොරකයි.

"කවුරුවත් දැක්කොත්" මම විමසුවෙමි.

"දකින්න ගේන්න එපා මෝඩයො. පිටිපස්සෙන් පලයං. පුටුවක් තියල දුමට නැගපන්. ඔඩොක්කුවට අතට අහුවෙන තරන් දා ගනින්. පලයන්. ඉතින් පලයන්. තාම මූණ දිහා බලං ඉන් නැතුව."

දැන් මට බේරුමක් ඇත්තේ ම නැත. මගේ සිතේ ද ''අලිඩොං'' පෙට්ටියේ හැඩරුව මැවී පෙනේ.

මම සරම කැහැපට ගසාගෙන කුස්සිය පැත්තෙන් ඇතුළු වී දුම ළඟට ගියෙමි. දුම උඩින් කිසිවක් තැබීම සහ ගැනීම සඳහා වෙන්වුණු පුටුවක් ද උළුවස්සට මදක් ඈතින් ඇත. කුස්සිය තරමක් අඳුරුය. ශබ්ද නො නැගෙන තරමට අමාරුවෙන් පුටුව ඇදගෙන විත් එයට ගොඩවී දුමේ එල්ලී පහළ දුමට ගොඩවූයේ අමාරුවෙනි. උඩදුමටද නැගගත් මා ඒ මත තිබුණු මුට්ටිවලින් කොකිස් මුට්ටිය සොයාගැනීමට මුට්ටි දෙකතුනක් ලිහා බැලීමට සිදු විය. අතට අසුවන ප්‍රමාණයට ගෙන කීප වරක් ම සරමේ ඔඩොක්කුවට කොකිස් දමාගෙන කැහැපට තදින් ගැට ගසා ගෙන දුමෙන් බැසීමට ලැහැස්ති වුණෙමි.

එක විටම කුස්සියට පැමිණි ආච්චි අඩ අඳුරේ ම දුම ළඟ තිබුණු පුටුවේ හැපී වැටෙන්නට ගොස් බේරුණේ අනූනවයෙනි. ''මොකීද මේ පුටුව තියල තියෙන්නෙ මෙතන. තව පොඩ්ඩෙන් මගේ බෙල්ලත් කැඩෙනව" යනුවෙන් පොඩි අම්මලාට බණිමින් ආච්චි පුටුව ගෙන නැවත උළුවස්සට එපිටින් තැබුවා ය. මා ගැහෙමින් දුමේ ම ගුලි වී සිටියෙමි. ආච්චී වෑංජන මදක් ඉතිරිව බිම තිබුණු ඇතිළියකට බත් ටිකක් හූරා දමා අනාගෙන කෑමට පටන් ගත්තේ සිට ගෙන ම දෙකට නැමීගෙන ය. බත්ටික කා අවසන්කර කළගෙඩියෙන් ඇතිළියට වතුර ටිකක් නවාගෙන ඇතිළියෙන් ම බී ඇතිළියද සෝදා බිමින් නවා තැබුවා ය. පොල්කොළ ටිකක් පත්තුකර ළිපේ ගිනි අවුලා කේතලයට වතුර වත්කර ළිප මත තබා ඉස්තෝප්පුව පැත්තට ගියා ය.

දැන් මට දුමෙන් බැසීමට විදියක් නැත. උස ප්‍රමාණය අනුව බිමට පැනීමටත් නො හැකි ය. ළිපේ දුම් රැළිද ක්‍රමයෙන් දුම් මැස්ස පසාකරගෙන ඉහළට නගී. දුමෙන් බිමට පැන ගැනීම මිස වෙන කරන්නට දෙයක් නැත. කෙළින් ම බිමට පැන්ණොත් කොන්ද කැඩෙන බව නම් සිකුරු ය. එහෙත් කෙසේ හෝ දුමෙන් බැසිය යුතු ය. නො එසේ නම් හොරකම අසුවීමෙන් වේවැල් පහර තට්ටම පුරා වදින වැදීම නැවැත්වීමට කෙසේවත් බැරි ය. දැන් ළිපේ රස්නයත් දුම මතට ක්‍රමයෙන් දැනේ. ළිපේ ඇවිළෙන ගිනි දැල්ද විටින් විට නෙතට අසුවේ. කර කියා ගන්නට කිසිම දෙයක් නොමැති නිසා ම අවසානයේ දුමෙන් පැනීමට තීරණය කර අමාරුවෙන් දුමේ එල්ලී කකුල් දෙක රූටවා පහළට ගතිමි. දුමේ එල්ලීගෙනම පහළ බැලූවිට ළිපේ ගින්දර කේතලය වටකරගෙන දඟලයි. දැන් කකුල් දෙකට දැනෙන රස්නයෙන් බේරීමට අත් දෙකෙන් එල්ලී සිටින අතරම, කකුල් දෙක ද දුමේ ම රැඳවූයෙමි. දැන් ගිනි රස්නය කෙසේවත් ඉවසා සිටීමට නො හැකි තරමට වැඩිවෙමින් පවතී. වැටුණොත් වැටෙන්නේ ළිප අසල ම ය. දැන් කළ හැකි එකම දේ කෑ ගැසීම පමණය. අතපය කඩා නොගෙන, ගින්නට නො පිළිස්සී පණකෙන්ද බේරාගත හැකි එකම මාර්ගය වෙනත් කවුරුන්ගේ හෝ පිහිට පැතීම ය. ඒ ගැන සිතා හෝ නොසිතා හැකි තරම් ශබ්ද නගා "ආච්චියේ" යයි බෙරිහන්දී කෑ ගැසුවෙමි. කුස්සියට එක විටම පැනගෙන ආවේ ආච්චි ය. ඒ එක්කම පැමිණියේ සුදු පොඩිඅම්මා ය.

දුමේ එල්ලී කෑ ගසන විට ඔවුනට පුදුම හිතෙන්නට ඇත. එහෙත් ඒ ගැන හිත හිත ඉන්නට වේලාවක් නො වූයෙන් ආච්චීද සුදු පොඩිඅම්මාද මා අල්ලා ඔසවා වහා බිමට ගත්තෝය. දැන් මාගෙ ඇඳුම දුමේ එල්ලී සිටින විට ඇඳූ ඇඳීමටද වැඩිය. ගුටි කන්නට වන බව සිකුරු ය. ආච්චි මා එක අතකින් අල්ලාගෙන අනික් අතින් පිටු පසට ගහගෙන ගහගෙන ගියා ය. ආච්චිගේ හිතේ හැටියට පහර කිහිපයක් ගසා මා ගෙන ගොස් බාර දුන්නේ ආතාට ය.

"පේනවද මේ කොල්ල තියෙන වැඩක්. කන්න ඕනෙනම් කිව්වම නොදෙනවද? තව පොඩ්ඩෙන් ළිප උඩ පෙල්ලිල මහ නස්පැත්තියක් වෙන්නේ. මොන දෙයියන්ට කියන්නද වැටුනනන් හෙම" තව තවත් මොනමොනවාදෝ කියමින් ආච්චී පැත්තක බලාසිටියේ කේන්තිය ඉහවහ ගොසිනි.

දැලිවලින් පින්තාරු වුණු ඇඟ කළුපාට ය. ආතා කළේ ඔඩොක්කුවේ තිබුණු කොකිස් සියල්ල කා අවසන් කරන ලෙස මට අණ කිරීම ය. මම අඬමින් ම කොකිස් එක එක කෑවේ ඇඹුල් දොඩම් ගහයට කොට්ටන් තළන ගල උඩ වාඩි වීගෙන ය. ආතා වේවැළත් අතේ තබාගෙන මිදුලේ ය. දැන් ගුටි කෑමටත් වැඩියෙන් ඉවසන්නට බැරි පාරේ යන අයගේත් ගෙදර අනිත් අයත් මා දෙස බලා විරිත්තමින් කරන කිචිකිචිය ය. කොකිස් ටික කෑමට මා කම්මැලි කළේ නැත. එම කොකිස් දහයදොළහ අවසන් කිරීමට මට වැඩි වේලාවක් ද ගියේ නැත. කොකිස් ටික අවසන් වූ පසු ආතා සන්ලයිට් කාලත්, පනිට්ටුවත් අතට ගෙන අමුඩ ලේන්සුව කරට දමාගෙන මා කැඳවාගෙන පාවුලේ ළිඳට ගියේ නාවා පිරිසිදු කිරීමට ය. මාමා ව දැක්කේ ඊට පසුවදා උදයේ ය. ඔහුගේ අණට මා කළ වැඩය හෙළි නොකරන ලෙසට ද ඔහු කළ අණද මම පිළිපැද්දෙමි .

## ආවර්ජනා



*මේ පාරෙම*
*මේ විදිහට*
*අප්පච්චිත් ඇවිද, ගියා*
*මට මතකයි*
*පුංචි කාලේ*

**සාමන්ත තැන්නගේ**




